MAY 2015
www.sannasa.net / www.sannasa.com

**ජනතා විමුක්ති පෙරමුණේද සහාය හිමිවූ ආණ්ඩුවේ දින 100 වැඩ සටහනේ කල් ඉකුත්වීම සහ 19 ව්‍යවස්ථා සංශෝධනය සම්මතවීමෙන් අනතුරුව ඒ පිළිබඳවත් වත්මන් සහ අනාගත දේශපාලන චලනයන් පිළිබඳවත් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සමඟ කළ සාකච්ඡාවකි.**



# නීතිවලින් පමණක් රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කළ නොහැකියි

## අනුර කුමාර දිසානායක

**නායක - ජනතා විමුක්ති පෙරමුණ**

**ආණ්ඩුවේ දින 100 වැඩ සටහනේ කාලය මේ වන විට අවසන් වී තිබෙනවා. සමස්ථයක් ලෙස ගත්විට දින 100 වැඩසටහන සාර්ථකද? අසාර්ථකද?**

සම්මිශ්‍රණයක් තිබෙන්නේ. එය මැතිවරණ ප්‍රකාශනයක් සඳහා වූ ආකර්ශණීය සටන් පාඨයක් පමණයි. අනික අපි කිසිසේත්ම හිතන්නේ නැහැ දින සීයකින් රටකට මහා පරිවර්ථන අත්කර දෙන්න පුළුවන් කියලා. අපේ රට මුහුණ දී සිටින ගැටළුවලට සමාජ ආර්ථික දේහයේ පුළුල් පරිවර්ථනයක් ඕනේ. ඒ පරිවර්ථනය කරන්න දින 100ට පුලුවන් කමකුත් නෑ. දින 100ට නායකත්වය දෙන කණ්ඩායමට පුලුවන් කමකුත් නෑ. නමුත් මේ දින 100 ඇතුළත අපි උත්සාහ කරමින් තිබුණා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යම් යම් වැදගත් සංශෙ-ෝධනයන් සහ නීති ටිකක් සම්මත කරගන්න. ඒ සඳහා වැදගත්ම සංශෝධනය ලෙස 19 වෙනි ආ-ණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වී තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ පනත විගණන පනත වගේ පනත් කීපයක් අනුමත කරගෙන තිබුණත් දින 100 තුළ ඒවා සම්මත කරගන්නට අවස්ථාව ලැබිලා නෑ. පළමුකොටම පැවැති රාජපක්ෂ පාලනය ඉවත් කිරීම තමයි ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පුළුල්තම ප්‍රගතිශීලී ජයග්‍රහණය හැටියට අපි සළකන්නේ.

**ඔබ හිතන විදිහට 19 වෙනි ව්‍යවස්ථා සංශෙ-ෝධනය සම්මත වුණේ ජනතාවගේ හෝ ආණ්ඩුවේ න්‍යාය පත්‍රයට අනුවද? එසේ නැත්නම් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ කැමැත්තට අනුවද?**

රාජපක්ෂගේ කැමැත්ත තිබුණේ මෙය කිසිසේත්ම සම්මතවීමට ඉඩ ලබා නොදීමට. ඔහුගේ සහචර කණ්ඩායම පාර්ලිමේන්තුව තුළත් එතනින් පිටතත් මුලුමනින්ම අදහස් ඉදිරිපත් කරනු ලැබුවේත්, ක්‍රියාත්මක වුණේත් මෙය වළක්වන්නයි. ඒ නිසා 19 වෙනි සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වෙනවා කියලා කියන්නේ රාජපක්ෂගේ මුළු සැළැස්මම අසාර්ථක වී බිඳවැටීමක්. ඒ වගේම සංශෝධනය වඩාත් යහපත් කරගන්න තිබුණා ඒ බල ගැටුම නිර්මාණය වෙලා නොතිබුණානම්. නමුත් ඒ බල ගැටුම විසින් ඒ ඒ බල වුවමනාවන් මත පදනම්ව මේ සංශෝධනය සකස් වූ ආකාරය තමයි අපි දැක්කේ.

**19 වෙනි සංශෝධනයෙන් මුලින්ම අපේක්ෂා කළ ප්‍රතිපල ලබාගන්නට නොහැකිවීමේ වගකීම පැවරෙන්නේ කාටද?**

රනිල් වික්‍රමසිංහ මහත්තයාටත්, මෛත්‍රීපාල සිරි-සේන මහතාගේ කණ්ඩායමටත් ඒ වගේම මහින්ද රාජපක්ෂ පිලටත් එහි වගකීම පැවරෙනවා. ව්‍යවස්ථාව ගොඩනැඟීමේදී ඔවුන් තමන්ගේ බල වුවමනාවන් කරළියට ගෙනාවේ නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදය දෙසට මීට වඩා සාර්ථක පියවරක් තැබීමේ හැකියාව තිබුණා. එය ජනතාවත් එක්ක කරන ගනුදෙනුවක් වුණානම් ජනතා විමුක්ති පෙරමුණ මුලුමනින්ම එහි වගකීම බාරගනිමින් වඩාත් ප්‍රජාතාන්ත්‍රික සංශෝධනයක් රටට ලබාදෙන බව අපි සහතික කරනවා. නමුත් වළක්වන්නට බැරි විදිහට මෙහි අවසන් තීරණ තියෙන්නේ පාර්ලිමේන්තුවේ ඔලුගෙඩි මත. ඒ ඔලු ගෙඩි මෙහෙයවෙමින් තිබුණේ විවිධ බල ගැටුම්වල වුවමනාවන් වෙනුවෙනුයි. ඒ තත්ත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අත්‍යාවශ්‍ය වගන්ති මෙහි ඇතුළත් කිරීමට නොහැකි තත්ත්වයක් නිර්මාණය වුණා.

**ජනතා විමුක්ති පෙරමුණත් ජාතික විධායක සභාවේ හිටියා. 19 වෙනි සංශෝධනය සම්මත කරගැනීම සඳහා ජනාධිපතිවරයාගේ තිබුණු උනන්දුව කොයිවගේද ඔබලා දුටුවේ?**

19වෙනි සංශෝධනය මගින් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් ශක්තිමත් කරගැනීම ඔහු ප්‍රකාශයට පත්කළ කැමැත්ත තුළ තිබුණා. හැබැයි ඔහු නායකත්වය දරන පක්ෂය ඊට පටහැනිව කටයුතු කරමින් තිබුණා. ඒ පිළිබඳ උපකල්පන දෙකකට එන්න පුලුවන්. එකක් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අප ඉදිරියේ කරන ප්‍රකාශත් ඔහුගේ පක්ෂය තුළ ඒකට පරස්පර අදහස් ඉදිරිපත් කිරීමත් ඔහුගේ සැළැස්මක් ලෙස අර්ථකථනය කරන්න පුලුවන්. එහෙම නැත්නම් තමන්ගේ පක්ෂය තමන්ට වුවමනා හැටියට මෙහෙයව ගන්න ඔහුට බැහැ කියලා අර්ථකථනය කරන්නත් පුලුවන්. මේ දෙකෙන් කෝකද කියන එක තීරණය කරගත හැකි වෙන්නේ මෙතෙක් සිදුවූ සිදුවීම්වලින් නොවෙයි. මින් පසුව සිදුවන සිදුවීම්වලිනුයි.

**19 සම්මත වීමත් සමඟ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳ තිබුණු කතා බහ සම්පූර්ණයෙන්ම නැවතුන බවක් පෙනෙනවා. ජනතා විමුක්ති පෙරමුණ හිතන ආකාරයට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම කියන සටන් පාඨය දැන් පැත්තකින් තියන්න පුලුවන්ද?**

නැහැ. මා හිතන්නේ නැහැ ඒ සටන් පාඨය ජනතාව පැත්තකින් තියලා හෝ



**සංවාද සටහන**

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

අවලංගු වෙලා හෝ කියලා. මේ ව්‍යවස්ථා සංශෙ-ෝධනයේ ක්‍රියාකාරිත්වය දෙස බැලුවත් පෙන්නුම් කරන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතු බව. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයෙන් ඒක කරන්න බෑ. මේ මොහොතේ කළ හැකි-වෙන්නේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන් එහි ඇති බලතල ඉවත් කරගැනීම පමණයි. විශාල බලතල ප්‍රමාණයක් ඉවත් කිරීමට 19 සංශෝධනයට ඇතුළත් කරලා තිබුණා. නමුත් වැදගත්ම සංශෙ-ෝධන පහක් ජනමත විචාරණයක් සඳහා ඉදිරිපත් කළ යුතුයි කියන යෝජනාව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉදිරිපත් කරලා තිබුණා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් ඒ තීන්දුව විසිනුත් සිදුවූ සිදුවීම් විසිනුත් ආවරණය කෙරුණු බලතල පිළිබඳ පුළුල් සංවාදයක් රට තුළ ඇති විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

**පවතින තත්ත්වයන් යටතේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගැනීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ අනුගමනය කරන දේශපාලන ක්‍රමවේදය මොකක්ද?**

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පමණක් නොවෙයි අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත්, එය ආර-ක්ෂා කරගැනීම සඳහා වන ව්‍යුහයත් ශක්තිමත් කරගත යුතුව තිබෙනවා. 19 වෙනි සංශෝධනයෙන් ඒ සඳහා යම් සැළකිය යුතු පියවරක් ගෙන තිබෙනවා. නමුත් ඉන් ඔබ්බට ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිසංස්කරණ අපට අවශ්‍යයයි. එළැඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී අපි ජනවරමක් අප-ේක්ෂා කරනවා නව ව්‍යවස්ථාවක් ගොඩනඟන්න. අපි ජනතාව හමුවට ගිහිල්ලා කියනවා අපේ රටට අලුත් ව්‍යවස්ථාවක් හදමු කියලා. ජනතාවගේ වුවමනාවන්ට ගැලපෙන විදිහට රටේ මූලික නීතිය හදමු කියලා. ඒ වෙනුවෙන් ඉදිරි මැතිවරණයේදී අපිට ජන වරමක් දෙන්න කියන ආයාචනය අපි කරනවා. එහෙත් අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ ව්‍යවස්ථාවේ නීතිවලින් පමණක් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළ හැකියි කියලා.

**ව්‍යවස්ථා, නීති වලින් පමණක් මතු වෙච්ච ගැටළුවක් නෙවෙයි මෙහි තිබෙන්නේ. මේක සමාජ ආර්ථික දේහයේ පතුලෙන් මතුවුණු ගැටළුවක්. ඒ නිසා සමාජ ආර්ථික දේහයේ පුළුල් පරිවර්තනයකුත් අවශ්‍යයයි ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි ව්‍යුහයන් ශක්තිමත් කරගැනීම වෙනුවෙන්. ඉදිරි මහ මැතිවරණයේදී ජනතා විමුක්ති පෙ-රමුණේ ප්‍රධාන සටන් පාඨය වෙන්නේ කුමක්ද?**

මේ වනවිට අපි ඒ සැළැස්ම සකස් කරමින් යනවා. මැතිවරණය ප්‍රකාශයට පත්කළ වහාම ඉතා ඉක්මනින්ම ඒ පිළිබඳ ජනතාවට අවබෝධයක් ලබාගන්නට පුලුවන් වේවි.

**මැතිවරණ ක්‍රමය වෙනසකින් පසුව කේවල ආසන ක්‍රමය සහිතව පැවැත්වෙන මැතිවරණයක් ජනතා විමුක්ති පෙරමුණට මොන විදිහට බලපායිද? වාසි සහගත වෙයිද? අවාසි සහගත වෙයිද?**

අපි කවදාවත් ඡන්ද ක්‍රම අපිට බාධාවක් කරගෙන නෑ. අපි ඡන්දෙ ඉල්ලන්නෙත් නැතිව දේශපාලනය කළ ව්‍යාපාරයක්. අපිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හම්බ වුණේ 1994ට පස්සේ. ඊට පෙර ඉතිහාසයේ ජනතා විමුක්ති පෙරමුණ දේශපාලනය කරලා තියෙන්නේ ඡන්දවලින් නෙවෙයි. මන්ත්‍රීධුර මත

**රාජපක්ෂත් රාජපක්ෂගේ සහචර කණ්ඩායමත් තමන්ගේ දේශපාලන බල ව්‍යාපෘතිය දියත් කරලා තිබෙන්නේ ජාතිවාදී ප්‍රවනතාවකින්. අන්න ඒ ජාතිවාදී ප්‍රවනතාවය රටට අහිතකරයි. ඒ නිසා රාජපක්ෂ පරාජය කළා වගේම රාජපක්ෂගේ ජාතිවාදී ප්‍රවණතාවයත් පරාජයට පත්කළ යුතුයි.**

පදනම් වෙච්ච දේශපාලන ව්‍යාපාරවලට මැතිවරණ ක්‍රම ප්‍රශ්න වෙන්න පුලුවන්. ජනතා විමුක්ති පෙරමුණට එහෙම ප්‍රශ්නයක් නෑ. අපේ සංවිධාන යාන්ත්‍රණය, ප්‍රචාරක ක්‍රමය සකස් කරලා තිබෙන්නේ මේ තියන සමානුපාතික මැතිවරණ ක්‍රමයට අනුරූපී වන පරිදියි. මේ ක්‍රමයට වෙනස් මැතිවරණ ක්‍රමයක් එන්නේ නම් ඊට අනුව අපි අපේ සංවිධාන යාන්ත්‍රණය, ප්‍රචාරක යාන්ත්‍රණය සකස් කරනවා. ඒ නිසා අපේ දේශපාලනයට ඡන්ද ක්‍රම බාධා-වක් නෙවෙයි.

නමුත් ඡන්ද ක්‍රමයක මූල ධර්මය පිළිබඳ අපි දැඩි ස්ථාවරයක ඉන්නවා. ජනතාවගේ කැමැත්ත ජනතා නියෝජිත ආයතන තුළ සාධාරණව පිළිඹිබු විය යුතුයි. ජනතාව යම් දේශපාලන ව්‍යාපාරයකට කැමැත්තක් තිබෙනවා නම් ඒ කැමැත්තේ පිළිබිඹුවක් පාර්ලිමේන්තුව තුළ තිබෙන්න ඕනේ. ඒ මූලධර්ම ආරක්ෂා වන ඕනෑම ඡන්ද ක්‍රමයක් වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටිනවා. ඕනෑම ඡන්ද ක්‍රමයක් හරහා දේශපාලන ජයග්‍රහණ අත්පත් කරගත හැකි වෙතැයි කියා අපි විශ්-වාස කරනවා.

**මේ වනවිට සකස් කෙරිලා කැබිනට් මණ්ඩලයෙනුත්**